සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved


# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

71 S I

තෙවන වාර පරීක්ෂණය - 13 ශ්‍රේණිය - 2024
Third Term Test - Grade 13 - 2024

## සිංහල - I

කාලය පැය 03 යි
අමතර කාලය මි. 10යි

- අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.

- පළමුවන ප්‍රශ්නය ඇතුළු ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න. (මෙම ප්‍රශ්නයට පිළිතුරු ලිවීමේ දී වර්තමාන ලේඛන ව්‍යවහාරය ම යොදා ගන්න.)

(01) පහත දැක්වෙන (අ) , (ආ) , (ඉ) , (ඊ) සහ (උ) උද්ධෘත අතුරින් සතරක් තෝරාගෙන ඒ ඇසුරෙන් අසා ඇති ප්‍රශ්නවලට ද (ඌ) හා (එ) ප්‍රශ්නවලට ද පිළිතුරු සපයන්න. (මේ ප්‍රශ්නයට පිළිතුරු ලිවීමේ දී වර්තමාන ලේඛන ව්‍යවහාරය ම යොදාගන්න.

(අ) ඌ තමන් පිටත් ශාස්ත්‍ර උගත් බව මුත් ශාසන සමය නොදන්නා, විචාළ ලෙසට විසඳන ලෙස නොදැන 'ඒ කිම් දැයි ස්වාමිනි'යි විචාළෝ ය. "හෙම්බා පරිබ්‍රාජිකාවෙනි, තෙලෙ බුදුන්ගේ පැනයෙකැ'යි කී සේක. තමන් ශාස්ත්‍ර ලෝභී හෙයින්' මාත් ස්වාමිනි, ඒ උගන්වා වදාළ මැනවැ'යි කිවූය. බුදුහු පවා දායාද ඉල්වූ රහල් කුමරුන්ට අප සේ ව ගෙන හැර ගනුව'යි වදාළ සේක. "තෙපිත් අප සේ වූ නම් දෙම්හ'යි වදාල සේක. එසේ වී නම් "මා මහණ කළ මැනව'යි කිවූය. මහතෙරුන් වහන්සේත් මෙහෙණින්නන්ට කියාලා මහණ කැරවූ සේක. උයින් මහණ ව මාලු පැවිදි ව කුණ්ඩලකේසී නම් ස්ථවිරිව.....

(i) සැරියුත් හිමි විමසූ පැනයට ජම්බු පිරිවැජිනියට නිසි අයුරින් පිළිතුරු දීමට නොහැකි වූයේ ඇයි ?

(ii) ශාසන පැවිද්ද ආයාචනා කළ ජම්බු පිරිවැජිනියට ලබා දුන් උපදේශය කුමක් ද?

(iii) "උයින් මහණව මාලු පැවිදි ව කුණ්ඩලකේසී ස්ථවිරිව" මෙය ලිහිල් බසින් ලියන්න.

(iv) "ශාසන සමය" යන්නට කෙටි විවරණ සපයන්න. (ලකුණු 04)

(ආ) එවේලෙහි අනුරුද්ධ කුමාරයෝ බෑණන් විසින් කියන ලද උපයා කෑමෙහි දුක් හා සංසාරයෙහි ආදීනව අසා තුන් භවය ගිනිගත් ගෙයක් සේ කොට සිතා සසර භය ගෙන වෙවුලා බෑණන්ගේ සම්පත් තබා තමන්ගේ ලක්ෂ ගණන් නළු පිරිස් හා තුන් සෘතුවට කළ තුන්පාය හා සියලු රජ සැපත අලුයම් දැමූ කෙළපිඩක් සේ සිතා සැපත් ලෝභය හැර "බෑණන් වහන්ස, උපයා කෑම නම්, සසර නම් මෙසේ දුකක් වනැයි මෙතෙක් දවස් නොදත්තෙමි. රන්තලිවලින් ම බත් උපදිති'යි සිතමි. මෙසේ වූ දුක් ඇති ගිහි වාසය මට නොකමැත්තේ ය. මට සනා ඇතියේ නම් නුඹ මහණවන්නට නොගොස් මා ම පළමු කොට මහණ වන ලෙස බුදුන් කරා යවාපුව මැනව'යි.

(i) අනුරුද්ධ කුමරුට සසර පිළිබඳ බියක් ඇතිවීමට හේතුව කුමක් ද?

(ii) අනුරුද්ධ කුමරු මහානාම ශාක්‍යයාගෙන් කළ ඉල්ලීම කුමක් ද?

(iii) "ලක්ෂ ගණන් නළු පිරිස් හා තුන් සෘතුවට කළ තුන්පාය" මෙය ලිහිල් බසින් ලියන්න.

(iv) "තුන් භවය" යන්නට කෙටි විවරණ සපයන්න. (ලකුණු 04)

(ඉ) මෙ ජාතකය එනාහී දුරේ නිදානයෙහි පටන් කිය යුතු ය. මේ දූරේ නිදාන කථාව දීපංකර පාදමූල නිදානයෙහි පටන් සමතිස් පෙරුම් පුරා කෙළවර පාරමිතා ධර්ම නැමැති මටුන්නෙහි අග්‍ර මාණික්‍යයක් බඳු වූ වෙස්සන්තර ජාතකයෙහි පුත්‍රදාරාදීන් පරිත්‍යාගයෙන් සත් වරෙක මහ පොළව ගුගුරුවා දෙවැනි අත් බැවිහි තුසි පුරයෙහි ඉපිද සත් පනස් කෙළ සැට ලක්ෂයක් අවුරුදු දෙවියන්ට ධර්ම දේශනා කොට දස දහසක් ලෝක ධාතුයෙහි දෙව් බඹුන්ගේ අයජමෙන් මහ පස් බැලුම් බලා මව්කුස පිළිසිඳ ගත් බව ද ලුම්බිණි වනෝද්‍යානයෙහි මහා බ්‍රහ්මයා අතට බිහි ව වැඩි විය පැමිණි සියලු ලෝක ධාතුයෙහි අසාදෘශාභිෂේක ප්‍රාප්ත ව උයන් කෙළියට යන සඳ දෙවියන් මවා දූ ජීර්ණ ව්‍යාධි මෘත යන තුන් පූර්ව නිමිත්ත දැක.

(i) වෙස්සන්තර ජාතකයෙහි දී අඹු දරුවන් දන් දුන් අවස්ථාවේ සිදු වූ ආශ්චර්ය සිදුවීම කුමක් ද?

(ii) බෝසතාණන් වහන්සේ තුසි පුරයෙහි ඉපිද දෙවියන්ට කොපමණ කාලයක් ධර්ම දේශනා පැවැත්වූයේ ද?

(iii) "සියලු ලෝක ධාතුයෙහි අසදෘශාභිෂේක ප්‍රාප්තව" මෙය ලිහිල් බසින් ලියන්න.

(iv) "තුන් පූර්ව නිමිත්ත" යන්නට කෙටි විවරණ සපයන්න. (ලකුණු 04)

(ඊ) මෙසේ ඒ වෙළෙඳාණන්ගේ භාර්යාවෝ නොයෙක් කාරණයෙන් තමන් කැඳවා ආ කෙල්ල ගිවිස්සා නික්ම වූහ. ඉක්බිති ඒ අමාත්‍යයා තමාගේ කෙල්ල අතින් එපවත් අසා ඒ බසටත් නොපසුබැස සාරදහසක් දී එම කෙල්ල නික්මවිය. එකල වෙළෙඳාණන්ගේ භාර්යාවෝ තුන්වන වාරයෙහි ආ කෙල්ල දැක "එම්බා නැඟණියෙනි, මේ අනුන් සන්තක වස්තුවෙහි වරදවා පිළිපදනේය'යි තොපගේ අමාත්‍යවරයාණන්ටත් නුහුඹ ය. මෝ තොම තමාගේ ගේ හිමියා ඉක්ම පවත්නීය යි මටත් නින්දා වන්නේ ය. මෙසේ වරදවා පිළිපැද්දාවුන් අපායෙහුත් නොමිදෙන්නාහු මය'යි කියා "මේ ලෝකයෙහි ස්ත්‍රී පුරුෂ යම් කෙනෙක් අනුන් සන්තක භාණ්ඩයෙහි වරදවා පවතිද්ද හෙවත් පුරුෂයෝ පර ස්ත්‍රී සේවනය කෙරෙද්ද ස්ත්‍රී ජාතීහු පරපුරුෂයන් සේවනය කෙරෙද්ද එසේ අපරාධ කළ ස්ත්‍රී පුරුෂ දෙපක්ෂයට ම නින්දාත් පැමිණෙයි. දඬුවම් ආදියත් වන්නේ ය. මෙසේ මෙලොව නොයෙක් බැසනත් විඳ පරලොව නරකයෙහි ඉපද සියක් යොදුන් උස ඇති සොළොසාඟුල් දිග කටු ඇති කොළ ඉඹුල් වෙනෙහි ඉවසිය නොහැකි දුක් විඳිති."

(i) ශිව අමාත්‍යයාට නුහුඹ පිණිස හේතුවන්නේ කුමක් ද?

(ii) වැරදි කාම සේවනයේ යෙදීමෙන් මෙලොව වශයෙන් අත්වන ආදීනව මොනවා ද?

(iii) "සියක් යොදුන් උස ඇති සොළොසාඟුල් දිග කටු ඇති" මෙය ලිහිල් බසින් ලියන්න.

(iv) "වෙනෙහි" යන්නට කෙටි විවරණ සපයන්න. (ලකුණු 04)

(උ) පුරඟන රඟ රඟ හළවෝ
දුටු දන මන නෙත් වෙළවෝ
මනයොන සැර කුසුමළවෝ
තැන තැන රඟදෙති නළවෝ

පුරවා තුරු රැවින් අහස
කරවා ගී නැටුම් වෙසෙස
අරවා සත සිත දොම්නස
පුරවාසී කෙළිති මෙලෙස

(i) නළුවන්ගේ නර්තනයේ උසස් බව ගුත්තිල කවියා අනාවරණය කළේ කෙසේ ද?

(ii) චූටි දනන්ගේ සිත්හි දොම්නස පහ වී ගියේ ඇයි ?

(iii) "මනයොන සැර කුසුමළුවෝ" මෙය ලිහිල් බසින් ලියන්න.

(iv) "තුරු රැවින්" යන්නට කෙටි විවරණ සපයන්න. (ලකුණු 04)

- (ඈ) සහ (ඉ) ප්‍රශ්න දෙකට ම පිළිතුරු සපයන්න.

(ඈ) පහත සඳහන් උද්ධෘත ඇසුරෙන් හතරක අවස්ථා සම්බන්ධය දක්වන්න.

(i) මේ ශරීරය කිසි ගත යුතු සාරයක් නැත්තේ ය.

(ii) තබන්නේ කවර දවසකට ද? ...

(iii) මා ඇරපියා නික්මුණු නියා දැ'යි ...

(iv) මම බත් නොකමි යි ...

(v) අක්කා මට හිරයක් ගන්න කාලෙ හො දා ...

(vi) අයියා කොයි වෙලාවෙද ආවේ ...

(vii) "විත් පෙරලා හැර ලන්නෙමු" ... (ලකුණු 3 x 4 = 12)

(ඉ) පහත සඳහන් පද්‍ය පන්තියේ භාෂා භාවිතය හා කාව්‍ය ආකෘතිය පිළිබඳ අවධානය යොමු කරමින් රසාස්වාදයක් කරන්න.

පඩි පෙළින් බැස අයින් වී එන්න
අලුත් මල් පොකුරු අරගෙන එන්න
පින්වතුනි, එන අයට ඉඩ දෙන්න
එපා පර මල් පයින් පාගන්න

බලන්මේ මල්හි පර මල් සුවඳ
කැඩුණු පෙතිවල තිබෙන මුදු මෙළෙක
මහලු මවු කෙනකුගේ මුව රැඳුණ
සිනාවක් සේ ප්‍රේමයෙන් පිරුණ

මලානික මල් රේණුවල පෙනෙන
අපරිමිත පැතුම්වල මුනුණුවර
සිය දහස් අත්වලින් පුදන ලද
උතුම් මිනිසත්කමේ ගුණ සුවඳ
බලන් තවමත් සුවඳ දෙන මහිම !

පඩි පෙළින් බැස අයින් වී එන්න
තිබේ පුදසුන හිස්ව ඔබ පිණිස
අලුත් මල් පොකුරු දෝතින් ගන්න
එපා පර මල් පයින් පාගන්න (ලකුණු 12)

(02) පහත (අ) කොටසේ ප්‍රශ්නය සහ (ආ) කොටසින් එක් ප්‍රශ්නයක් තෝරාගෙන පිළිතුරු සපයන්න.

(අ) "සද්ධර්මරත්නාවලිය කතු හිමි පුද්ගල මනෝභාවයන්හි විවිධත්වය මැනවින් නිරූපණය කිරීමට සමත් ව ඇත." නිර්දිෂ්ට කථා ඇසුරින් විමසන්න.

නැතහොත්

ආධ්‍යාත්මික ආශාවන් පසුපස හඹා යෑමෙන් පුද්ගලයා පත්වන බෙදවාචක අනාවරණය කිරීම ජාතක කතාකරුවාගේ එක් අභිලාෂයක් ව ඇත. නිර්දිෂ්ට කථා ඇසුරින් විමසන්න.

(ලකුණු 15)

(03) පහත (අ) කොටසේ ප්‍රශ්නය සහ (ආ) කොටසින් එක් ප්‍රශ්නයක් තෝරාගෙන පිළිතුරු සපයන්න.

(අ) දඹදෙණි සාහිත්‍යය යුගයට අයත් ගද්‍ය සාහිත්‍ය කෘති අතුරෙන් දෙකක් පිළිබඳ හැඳින්වීමක් කරන්න.

(ලකුණු 07)

(ආ) ඉඩක් ලද විගස කුශලාකුශල කර්ම, විපාක දෙන අයුරු ළඟන්නා සුලු අයුරින් නිරූපණය කිරීමට සද්ධර්මාලංකාර කතුවරයා සමත් වේ. නිර්දිෂ්ට කථා ඇසුරෙන් විමසන්න.

නැතහොත්

අභව්‍ය සිද්ධි වුව ද පාඨකයාගේ විශ්වසනීයත්වය දිනා ගැනීමට සමත් අයුරින් පූජාවලියේ කථා වස්තු නිර්මාණය වී තිබේ. නිර්දිෂ්ට කථා වස්තුවලින් නිදසුන් සහිත ව පැහැදිලි කරන්න.

(ලකුණු 08)

(04) ගුත්තිල කාව්‍ය රමණීය කාව්‍යයක් බවට පත්ව තිබෙන්නේ ශබ්දාර්ථ සුසංයෝගයෙන් අනූන පද්‍ය ඇතුළත් වීම හේතුවෙනි. වර්ණනා දෙකක් ඇසුරෙන් සාකච්ඡා කරන්න. (ලකුණු 15)

(05) සාර්ථක චරිත හා සිද්ධි නිරූපණය උදෙසා බැද්දේගම පරිසරය හා සමාජ සංස්කෘතික පසුබිම කතුවරයාට ඉවහල් වූ බව බැද්දේගම නවකතාව ඇසුරින් පෙන්වා දෙන්න.

(06) දරිද්‍රතාව හේතුවෙන් පීඩාවට පත්වන ජන ජීවිතයෙහි යථාර්ථය කලාත්මක ලෙස ප්‍රතිනිර්මාණය කිරීමෙහිලා නූතන සිංහල කෙටි කතාකරුවන් සමත් වී ඇත. නියමිත කෙටි කතා තුනක්වත් ඇසුරෙන් පැහැදිලි කරන්න. (ලකුණු 15)

(07) සෑම කාව්‍ය නිර්මාණයකට ම කිසියම් අද්දැකීමක් මුල් වී ඇති බවත්, කවියා විසින් එම අද්දැකීම ප්‍රතිනිර්මාණය සඳහා සුදුසු කාව්‍ය ආකෘතියක් හා උචිත භාෂාවක් යොදාගෙන ඇති බවත් නිදර්ශන සහිත ව පෙන්වා දෙන්න. (ලකුණු 15)

(08) ඒ ඒ අවස්ථාවට උචිත පරිදි භාෂාව උපයුක්ත කර ගැනීමට සරච්චන්ද්‍රයන් දක්වන සාමර්ථ්‍යය නිදසුන් තුනක්වත් උපයෝගී කර ගනිමින් විමසුමට ලක්කරන්න. (ලකුණු 15)

- මෙම කොටසින් 02, 03 ප්‍රශ්න ඇතුළු ව ප්‍රශ්න සතරකට පිළිතුරු සපයන්න.

(02) (අ) පහත සඳහන් පාඨය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

කාව්‍යයේ ක්ෂේත්‍රය හා ගීතයේ ක්ෂේත්‍රය යම් තැනක දී එකට හා වෙනත් මේ දෙකේ සීමාවන් තිබෙන බව ද සැලකිය මනා ය. කාව්‍යයෙන් ලැබිය නොහැකි රසයක් ගීතයෙන් ලැබිය හැකි ය. ඒ වනාහී ස්වර, තාල හා ලය ආශ්‍රයෙන් ලැබෙන්නකි. එමෙන් ම ගීතයෙන් ලැබිය නොහැකි රසයක් කාව්‍යයෙහි ඇත. ඒ රසය වචනවල ශක්‍යතාව මත රඳා පවතින්නකි.

කාව්‍යය නිශ්ශබ්ද ව කියවා රස විඳීමට මිනිසුන් පුරුදු වූයේ මුද්‍රණ යුගයේ උදාවීමෙන් පසු ය. එහෙත් ආදියෙහි පටන් ගායනය හා එක් ව තිබුණු බැවින් දෝ ශ්‍රවණේන්ද්‍රියෙන් රස විඳීම කාව්‍ය රසාස්වාදනයේ අනිවාර්ය ලක්ෂණයක් බවට පත් වී ඇත්තා සේ පෙනේ. ස්වර ගායනයක් තිබුණත් නොතිබුණත් මිනිසුන් කාව්‍ය රසය වින්දේ වචනවල හඬට කන් දීමෙන් මිස ලිඛිත සටහන් බැලීමෙන් නොවේ. අද දක්වාත් කාව්‍ය රස වින්දනයෙහි දී මුද්‍රිත වචනයෙන් කෙරෙන්නේ ශෝත්‍රද්වාරගත අරමුණු සිහියට නැංවීමේ කාර්යයයි හැඟේ. රසයට ආශ්‍රය කාරණය වන්නේ ශ්‍රැත වචනය මිස දෘෂ්ට වචනය නොවෙතියි කිව හැකි ය. වාර්තාවක් කියවීමෙහි මෙන් නොව කාව්‍ය කියවන විට මුළු වාක්‍යයක් හෝ කොටසක් සමස්තයක් වශයෙන් ඇසට ගොදුරු කරවා අර්ථය අවබෝධ කර ගැනීමෙන් රසයක් විඳිය නොහැකි ය. හැම වචනයක් ම පාඨකයා විසින් නිශ්ශබ්ද ව හෝ උච්චාරණය කළ මනා ය. හැම වචනයක ම හඬක් ඔහුට ඇසෙන්නා සේ විය යුතු ය. පද යෝජනයේ පිළිවෙළ ඔහුගේ මනින්ද්‍රියට ගොදුරු වුව මනා ය.

(i) කාව්‍ය රස වින්දනයේ අනිවාර්ය ලක්ෂණයක් ලෙස පෙනෙන්නේ කවරක් ද?

(ii) ගීතයෙන් ලැබිය නොහැකි රසයක් කාව්‍යයෙහි පවතින්නේ කුමක් මත ද?

(iii) ගීතයෙහි රසය මතුවන්නේ කුමන දේ ඇසුරෙන් ද?

(iv) මුද්‍රණ යුගය උදාවීම කාව්‍ය කෙරෙහි බලපෑවේ කෙසේ ද?

(v) රසයට ආශ්‍රය කාරණය වන්නේ කුමක් ද?

(vi) ශ්‍රවණේන්ද්‍රිය, මනින්ද්‍රිය යන වචනවල අර්ථ පැහැදිලි කරන්න. (ලකුණු 2 x 6 = 12)

(ආ) පහත දැක්වෙන උද්ධෘතය කියවා, එහි වචන සංඛ්‍යාව තුනෙන් එකක් පමණ වන සේ සාරාංශ කොට ලියා, සාරාංශය අග වචන සංඛ්‍යාව ද සඳහන් කරන්න.

පුරාතන යුගයට අයත් වන චීන පද්‍යවල දක්නට ලැබෙන විශිෂ්ට ලක්ෂණයක් වශයෙන් විචිත්‍ර සංකල්ප රූප භාවිතය දැක්විය හැකි ය. ඒවායේ ඉතා පැහැදිලි උපමා, රූපක, සංකේතාදිය ඇතුළත් ව තිබෙන අතර ම ඇතැම් පද්‍ය සමස්ත වශයෙන් ගත්කල ද ප්‍රබල රූපක බවට පත්වේ. පැරණි චීන පද්‍ය අරභයා නවීන බටහිර විචාරකයන්ගේ සිත් බෙහෙවින් ඇදී ගියේ මෙම සංකල්ප රූප භාවිතය කෙරෙහි ය. විසි වන සියවසේ එංගලන්තයේ හා ඇමරිකා එක්සත් ජනපදයේ පද්‍ය කාව්‍ය ක්ෂේත්‍රයෙහි උග්‍ර විප්ලවයක් ඇති විය. එහි ප්‍රතිඵලයක් වශයෙන් සමකාලීන විඥානය ප්‍රබල ලෙස නිරූපණය කිරීමට උචිත කවි කලාවක් බිහි වූයේ ය. එබඳු කවි කලාවක් බිහි කිරීමට සුප්‍රකට කවියෙකු හා විචාරකයකු වන එස්රා පවුන්ඩ්ගෙන් ඉටු වූයේ විපුල මෙහෙයකි. දහවන සියවසෙහි අගභාගයේ සිට ජනප්‍රිය ව පැවති කාව්‍ය රචනාවල පැහැදිලි වාග් චිත්‍ර වෙනුවට අවිචක්ෂිත හැඟීම් පටල ඇතුළත් කර තිබිණි. මේ තත්වය වෙනස් කිරීමට එස්රා පවුන්ඩ් වැනි කවියෝ පුරෝගාමී වූහ.

සංකල්ප රූප බුද්ධිමය වූත්, භාවමය වූත් සංකීර්ණයක් එක් ක්ෂණයකින් ඉදිරිපත් කරන්නට සමත් වන්නක් හැටියට හැඳින් වූ ඔහු මධ්‍යම ගණයේ ග්‍රන්ථ රාශියක් නිෂ්පාදනය කිරීමට වඩා එක් ප්‍රබල සංකල්ප රූපයක් නිර්මාණය කිරීමට කවියෙක් සමත්වේ නම් එය ප්‍රමාණවත් බව පැවසී ය. කාව්‍ය නිර්මාණයෙහි ලා සංකල්ප රූප කෙතරම් වැදගත් කොට සලකන ලද්දේ ද යන්න මින් පැහැදිලි වන්නේ ය. සංකල්ප රූප කෙරෙහි ප්‍රමුඛ ස්ථානයක් කවිහු සංකල්ප රූපවාදය යනුවෙන් සාහිත්‍යික වාදයක් බිහි කළහ. (ලකුණු 13 යි.)

(03) දී ඇති මාතෘකාවලින් එකකට අදාළ ව වචන 300 - 350 අතර වන සේ විශ්ලේෂණාත්මක රචනාවක් ව්‍යාකරණානුකූල ව ලියන්න.

(i) යුධ ගැටුම් නිසා බිඳවැටෙන මානව අයිතිවාසිකම් හා ලෝක සාමය

(ii) යහපත් ආණ්ඩුකරණය වෙනුවෙන් සිදුවිය යුතු දේශපාලනික පරිවර්තන

(iii) රසිකයාගේ වින්දන ශක්තිය හා ජීවිතාවබෝධය පුබුදු කිරීමට සුභාවිත ගීතයේ බලපෑම

(iv) සමාජ මාධ්‍ය වත්මන් තරුණ පරපුර කෙරෙහි ඇති කරන බලපෑම ✓

(v) නවීකරණය අබියස ලාංකීය අධ්‍යාපනය වෙනස් විම කෙබඳු විය යුතු ද? (ලකුණු 25)

(04) (අ) පහත දැක්වෙන වාක්‍යවල සදොස් තැන් ඇතොත් නිදොස් කොට ලියන්න.

(i) වර්තමාන සමාජයේ ටික දෙනෙක් කුසල් රැස් කරයි.

(ii) විශේෂඥ වෛද්‍යාචාර්යතුමා රෝගියා මරණින් මුදති.

(iii) කර්මාන්තශාලා හිමියෝ කම්කරුවන් ලවා තේ දළු කඩවයි.

(iv) සොරු ගෙට පනිති'යි සිතූ නාන්නා නිදිවරමින් රැය පහන් කළේ ය.

(v) ගුරුවරුන් නිසි මග පෙන්නුව ද ඇතැම් සිසුනු ඒ මඟ නොයත්

(ලකුණු 1 x 5 = 05)

(ආ) පහත දැක්වෙන වාක්‍ය කර්මකාරකයට හරවන්න.

(i) පවුලේ වැඩිමහල් සොහුරිය සිය බාල සොයුරිය රැකබලා ගන්නා ය.

(ii) බඹරු වද කඩන්නට පැමිණි වැද්දන්ට දෂ්ට කරති.

(iii) මව මහත් වෙහෙසක් දරා නංගී ද, මල්ලී ද, මා ද වෛරස් උණෙන් බේරාගන්නා ය.

(iv) පුරාණ රජවරු වාරි ශිල්පීන් ලවා මහා වාරිකර්මාන්තයන් නිර්මාණය කළාහු ය.

(v) දේශ ප්‍රේමීහු ඉතා වැදගත් යෝජනාවන් ඉදිරිපත් කරති.

(ලකුණු 1 x 5 = 05)

(ඉ) නිවැරදි වාක්‍යයක් නිර්මාණය කිරීමට සුදුසු පදය වරහන් තුළින් තෝරා ලියන්න.

(i) (මිනිසුන් / මිනිස්සු) පාර සොයද්දී (අප / අපි) එතනට ගියෙමු.

(ii) අම්මා හෝ (මම / මා) හෝ හෙට උදෙන් ම ගමට (යමි / යමු)

(iii) (කුමාරවරුන් / කුමාරවරු) පෙරහැර බලති'යි (මවබිසවතොමෝ / මවබිසවතුමී) පැවැසුවා ය.

(iv) (ගායිකාවක / ගායිකාවක්) සමග (ප්‍රේක්ෂකයන් / ප්‍රේක්ෂකයෝ) රඟහලට එති.

(v) දඟකාර (සිසුවෙකු / සිසුවෙක්) ව සිටි ඔහු දක්ෂ (සිසුවෙකු / සිසුවෙක්) ලෙස පාසලින් සමුගන්නේ ය.

(ලකුණු 1 x 5 = 05)

(05) පහත දැක්වෙන වාක්‍යවල තද කළු අකුරෙන් මුද්‍රිත පදවල ව්‍යාකරණ අංගය දක්වා ඇත. ඒවායෙහි අනු අංගය දක්වන්න.

(i) **විරත්තන වැනුම් මගෙහි නළගන රුව අභිරුචියෙන් වැනූ කවියෝ සුලබ වූහ.**

(විරත්තන - තද්ධිත / නළගන - සන්ධි / වැනූ - කෘදන්ත)

(ii) **ස්ත්‍රීපුරුෂ දෙපක්ෂය ම ආර්ථික ජයග්‍රහණයේ උරුමක්කාරයෝ වෙති.**

(ස්ත්‍රීපුරුෂ - සමාස / ම - නිපාත / උරුමක්කාරයෝ - සන්ධි)

(iii) **අධ්‍යක්‍ෂ මණ්ඩලය තීරණයක් ගෙන ජනතාවට ඉදිරිපත් කරාවි.**

(අධ්‍යක්‍ෂ - උපසර්ග / ගෙන - ක්‍රියා / ජනතාවට - විභක්ති)

(iv) **රාජභෝජන වැළඳීම් වස් ගෘහෝද්‍යානයට පිවිසි රාජපුරුෂයෝ ප්‍රීතිඝෝෂා කළෝ ය.**

(වස් - නිපාත / රාජපුරුෂයෝ - සමාස / ප්‍රීතිඝෝෂා - සමාස)

(v) **මිහිපිට වසන්නා වූ සකල ප්‍රඥාවන්තයෝ ධර්මයෙන් විපුල ඵල ලබත්වා !**

(ප්‍රඥාවන්තයෝ - තද්ධිත / ධර්මයෙන් - විභක්ති / ලබත්වා - ක්‍රියා) (ලකුණු 3 x 5 = 15)

(06) (අ) පහත දැක්වෙන වාක්‍යවල හිස්තැනට වඩාත් ම ගැළපෙන පදය වරහන් තුළ දී ඇති පද අතුරෙන් තෝරා ලියන්න.

(i) බුදුහිමියේ උපදෙස් අනුව භික්ෂූහු .................................... මඟට පිවිසුණහ.

(ii) රටපුරා පැතිර යන වසංගතය නිසා දිනපතා ......................... පත් බෙදාහැරීම ද අඩපණ වී ඇත.

(iii) ලොව ම වෙළාගෙන ඇති ආර්ථික අර්බුදය පිළිබඳ ................................ පත්‍රවල විශේෂාංග ලිපි පළවිය.

(iv) කුසල්වලින් ඇත් වූ බොහෝ දෙනා ........................................................ මාර්ගය අනුරා ගනිති.

(v) සිදත් සඟරා කතුවරයාගේ මතය අනුව පද .................................... කිරීම මගින් ද අලුත් පදයක් සැකසීම සිදු කළ හැකි ය.

(vi) වෙළඳසැලේ පවතින භාණ්ඩ හිඟය නිසා ............................. භාණ්ඩ කෙරෙහි පාරිභෝගික අවධානය යොමු වී ඇත.

(අදෙස් / නිවන් / ප්‍රවෘත්ති / ආදේශ / නිර්වාණ / පුවත්)

(ලකුණු ½ x 6 = 03)

(ආ) පහත දක්වා ඇති පද සන්ධි කර ලියන්න.

(i) අඹ + මල් (ii) දෙ + අත (iii) හෙළි + අඹි

(iv) විදුරු + අවියේ (v) පොරෝ + අ (vi) සත් + දවස

(ලකුණු ½ x 6 = 03)

(ඉ) තද කළු අකුරෙන් මුද්‍රිත පදවල විභක්ති නම් කරන්න.

(i) අම්මා **ළිඳෙන්** වතුර කළයක් ගෙනාවා ය.

(ii) මල්මල් **ගවුමකින්** සැරසුණු මැණිකා **කොණ්ඩයෙහි** මලක් ගැසුවා ය.

(iii) ඒ **දියණිය** විසින් දෙමව්පියෝ රැකබලා ගනු ලබති. (ලකුණු ½ x 6 = 03)

Downloaded from Past Papers Wiki - Most Extensive Wikipedia of Past Papers!

(ඊ) අවශ්‍ය තැන්වල විරාම ලක්ෂණ යොදා පහත දැක්වෙන කොටස නැවත ලියන්න.

එහෙම තමයි ඔවා වෙන්නෙ නේද බොල දැන් ඉතින් කුප්මා ඉයෝනිව් ඉවරයි. එයා අපට ජීවත් වෙන්න ඉඩහැරලා ගියා එය නම් ඩොක් ශාලා කම්මුතු උණා හිතපන් ඔන්න උඹට පැටියෙක් හිටියා ඒ පැටියගේ අම්මා උඹයි ඌ හිටි හැටියේ උඹව තනිකරලා ගියා එක දුකයි නොවේද බොල

(ලකුණු ½ x 6 = 03)

(උ) පහත දැක්වෙන ප්‍රකාශවල එක් එක් ප්‍රකෘති කථනය විකෘති කථනයට හරවා ලියන්න.

(i) "අපි රෝග මර්දනයට කාර්ය සාධක බලකායක් පත් කරනවායි" සෞඛ්‍ය ඇමැතිවරයා ප්‍රකාශ කළේ ය.

(ii) "මම දිවිහිමියෙන් රට සුරකිමි" රණවිරුවා ප්‍රතිඥා දුන්නේ ය.

(iii) "මම හෙට මව් බිමෙන් පිටව යමි'යි කමල් පැවැසී ය." (ලකුණු 1 x 3 = 03)

(07) පහත සඳහන් ඡේදය කියවා අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

ලෝකයේ විවිධ දිශාභාගයන්හි වෙසෙන විවිධ මනුෂ්‍ය සමූහ අතර විවිධ භාෂා මහත් සංඛ්‍යාවක් භාවිත වන බව අපි දනිමු. ලක්දිව වෙසෙන අපට අප අවට භාවිත වන සිංහල, දෙමළ, වැදි, ඉංග්‍රීසි, හින්දි, බෙංගාලි, උර්දු යනාදි භාෂා රාශියක් අසන්නට හා දකින්නට ලැබේ. දැනට ලෝකයේ භාෂා හාරදහසකටත්, පන්දහසකටත් අතර සංඛ්‍යාවක් වෙතැ'යි ගණන් බලා ඇත. මෙසේ මනුෂ්‍යයන් අතර විවිධ භාෂා මහත් සංඛ්‍යාවක් භාවිත වන හෙයින් මනුෂ්‍යයන් වෙන් වෙන් ලෙස වර්ග වී සිටින බැව් අපි දනිමු. සමස්ත මනුෂ්‍ය වර්ගයා ම එක භාෂාවක් භාවිත කරන්නේ නම් එය මනුෂ්‍ය සංහතියේ අභිවෘද්ධියට අතිශයින් හිතකර වනවාට සැක නැත. එහෙත් මනුෂ්‍යයෝ ලේ උරුමය නිසා මෙන් ම තම තමන් භාවිත කරන භාෂාව නිසා වෙන වෙන කොටස්වලට වර්ග වී සිටිති. මේ අනුව සිංහලයෝ ය, දෙමළු ය, වැද්දෝ ය, ඉංග්‍රීසිකාරයෝ ය, ඇස්කිමෝවරු ය යනාදි කොටස් රාශියක් අපි මනුෂ්‍ය වර්ගයා තුළ දකිමු.

(i) ඡේදයේ තද කළු අකුරින් මුද්‍රිත වචන අකාරාදි පිළිවෙළින් ලියන්න.

(ii) ලෝකයේ, දිශාභාගයන්හි, උරුමය යන වචනවල යෙදී ඇති පිලි වෙන වෙන ම ලියන්න.

(iii) මෙහි ඇති තුල්‍යාර්ථයේ නිපාතයක්, හේත්වර්ථයේ නිපාතයක් සමුච්චයාර්ථයේ නිපාතයක් උපුටා දක්වන්න.

(iv) පන්දහස, වැද්දෝ, රාශියක් යන පද විසන්ධි කරන්න.

(v) "භාෂාව" යන වචනයේ අන්තර්ගත ව්‍යඤ්ජනාක්ෂරයන්හි උත්පත්ති ස්ථාන වෙන වෙන ම නම් කරන්න.

(ලකුණු 3 x 5 = 15)

(08) පහත සඳහන් මාතෘකාවලින් තුනක් තෝරා කෙටි සටහන් ලියන්න.

(i) මූර්ධජ අක්ෂර

(ii) ආදේශ සන්ධිය

(iii) අවධි විභක්ති සමාස

(iv) කරණකාරක කෘදන්ත

(v) මිශ්‍ර ක්‍රියා

(ලකුණු 5 x 3 = 15)



Downloaded from Past Papers Wiki - Most Extensive Wikipedia of Past Papers!

PARCEL NO

LOL.lk
BookStore

# විභාග ඉලක්ක
## පහසුවෙන් ජයගන්න

ඕනෑම පොතක් ඉක්මනින්
නිවසටම ගෙන්වා ගන්න





කෙටි සටහන් | පසුගිය ප්‍රශ්න පත්‍ර | වැඩ පොත් සඟරා | O/L ප්‍රශ්න පත්‍ර |
A/L ප්‍රශ්න පත්‍ර | අනුමාන ප්‍රශ්න පත්‍ර | අතිරේක කියවීම් පොත් |
School Book ගුරු අතපොත්

PADANAMA PUBLICATION · pesuru Prakashana Private Ltd. · Akura Pilot · සමනල දැනුම · සතර

පෙර පාසලේ සිට උසස් පෙළ දක්වා සියළුම ප්‍රශ්න පත්‍ර,
කෙටි සටහන්, වැඩ පොත්, අතිරේක කියවීම් පොත්, සඟරා

**සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් ගෙදරටම ගෙන්වා ගැනීමට**

www.LOL.lk වෙබ් අඩවිය වෙත යන්න